00191

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
**සමාජ අධ්‍යයන දෙපාර්තමේන්තුව**
**සමාජ විද්‍යාව පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව - 2 වන මට්ටම**
**අවසාන විභාගය 2024 /25 (II වන අර්ධවාර්ෂිකය)**
**DSC2714 - සමාජ විද්‍යාවේ පදනම**

දිනය : 2025 අගෝස්තු 03 — **වේලාව : ප. ව.1.30- ප. ව.4.30**

**උපදෙස් අවධානයෙන් කියවන්න**
**කාලය : පැය තුනයි (පැය 03යි)**

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**01.** සමාජ විද්‍යාවේ වර්ධනයට බලපෑ ප්‍රධාන සමාජ වෙනස්කම් මොනවාද?

**02.** සමාජ විද්‍යාත්මක පරිකල්පනය (sociological imagination) පුද්ගලයන්ට පුද්ගලික අත්දැකීම් සහ සමාජ ව්‍යුහය අතර සම්බන්ධය අවබෝධ කර ගැනීමට උදව් කරන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

**03.** සමාජානුයෝජනය (socialization) ක්‍රියාවලිය විස්තර කර, එමගින් මානව සහ සමාජ සංවර්ධනය කෙරෙහි වන වැදගත්කම පැහැදිලි කරන්න.

**04.** සමාජ විද්‍යා පර්යේෂණ ක්‍රමවේදයේ ප්‍රධාන පියවර <u>උදාහරණයක්</u> අනුසාරයෙන් සාකච්ඡා කරන්න.

**05.** සමාජ විද්‍යාවේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවල ශක්තීන් සහ සීමාකම් උදාහරණ ඇසුරෙන් සාකච්ඡා කරන්න.

**06.** සමාජ විද්‍යාවේ පහත සඳහන් න්‍යායාත්මක පර්යාවලෝක වලින් එකක් පිළිබඳ සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුරේ එහි මූලික අදහස්, ප්‍රධාන චින්තකයන්, සහ සමාජ හැසිරීම් පැහැදිලි කිරීමට එය උපකාර වන ආකාරය සඳහා උචිත උදාහරණ සපයන්න.

අ) කෘත්‍යවාදී පර්යාවලෝකය (Functionalist Perspective)

ආ) ඝට්ටනවාදී පර්යාවලෝකය (Conflict Perspective)

**07.** මානවකේන්ද්‍රතාවාදය (ethnocentrism) යනු කුමක්ද? සමාජයේ එය පිළිබිඹු වන ආකාර සම්බන්ධයෙන් උදාහරණ ලබා දෙන්න.

**08.** අපරාධ (crime) සහ අපගමනය (deviance) අතර වෙනස කුමක්ද? උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

**09.** පහත සඳහන් ඕනෑම දෙකක් (02) සඳහා කෙටි සටහන් ලියන්න

I. සමාජ ව්‍යුහය (Social structure)
II. ගෝලීය සංස්කෘතිය (Global Culture)
III. සංස්කෘතික සාපේක්ෂතාවාදය (Cultural relativism)
IV. සියදිවි නසාගැනීම පිළිබඳ එමිල් ඩර්කයිම්ගේ අධ්‍යයනය (Emile Durkheim's study of suicide)
V. සමාජ ස්ථරායනය (Social stratification)

*****සියලු හිමිකම් ඇවිරිණි*****